මාර්ග නඩත්තු භාර අරමුදල ( ආර්එම්ටීඑෆ්) - 2014

---

මාර්ග නඩත්තු භාර අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ භාණ්ඩාගාර ලේකම් හා මාර්ග නඩත්තු භාර අරමුදලේ භාරකරුවන් අතර 2005 දෙසැම්බර් 09 දින එළඹි මාර්ග නඩත්තු භාර ඔප්පුවේ II වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

1.2 මාර්ග නඩත්තු භාර අරමුදල ස්ථාපිත කිරීම

---

භාර ආඥපනත යටතේ අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහිතව 2005 දෙසැම්බර් 09 දින අත්සන් කරන ලද භාර ඔප්පුව මඟින් නඩත්තු භාර අරමුදල පිහිටුවා ඇත. ආරම්භයේදී මාර්ග සංවර්ධන අධිකාරිය නඩත්තු කරන මාර්ග සඳහා අරමුදල් සැපයීමට අපේක්ෂා කරන ලද අතර පසුව පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය නඩත්තු කරන මාර්ග ද මාර්ග නඩත්තු භාර අරමුදලට ඇතුළත් කරන ලදී. එබැවින් ඒ හා බී පන්තියේ මාර්ග නඩත්තු කිරීම සඳහා වගකිව යුතු මාර්ග සංවර්ධන අධිකාරිය මාර්ග නඩත්තු භාර අරමුදලේ වර්තමාන ප්‍රධාන ප්‍රතිලාභියා වේ. මාර්ග නඩත්තු භාර අරමුදල භාර මණ්ඩලයක් මඟින් කළමනාකරණය කරනු ලැබේ. වාර්ෂික අයවැය මඟින් මාර්ග නඩත්තු භාර අරමුදලට අරමුදල් සපයනු ලැබේ. ආරම්භකව 2012 වර්ෂයේ සිට 2014 සැප්තැම්බර් දක්වා කාල පරිච්ඡේදය සඳහා රු.මිලියන 1,365 කට සමාන එජඩො මිලියන 10.5 ක් මාර්ග අංශ සහාය ව්‍යාපෘතිය මඟින් සැපයීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් එකඟ වී තිබුණි. ඉන් රු.මිලියන 1,300 කට සමාන එජඩො මිලියන 10 ක් කාලීන නඩත්තු කටයුතු සඳහා මූල්‍යයනය කිරීමට වෙන් කර තිබුණු අතර භාර අරමුදලේ පුනරාවර්තන පිරිවැය සඳහා රු.මිලියන 65 කට සමාන එජඩො මිලියන 0.5 ක් වෙන්කර තිබුණි.

1.3 භාර අරමුදල

---

අරමුණු

---

භාර ඔප්පුවේ 4 වගන්තිය අනුව භාර අරමුදලේ අරමුණු වන්නේ,

(අ) මාර්ග ජාලයේ පිරිහීම වළක්වා ගැනීම සඳහා ජාතික මාර්ගවල එදිනෙදා හා කාලීන මාර්ග නඩත්තු වැඩසටහන් සඳහා මූල්‍යයනය කිරීම.

(ආ) මාර්ග නඩත්තු කටයුතු සඳහා වහාම අවශ්‍ය නොවන අරමුදල් හෝ කොටසක් සුදුසු ආකාරයට ආයෝජනවල හා සුරැකුම්වල විචක්ෂණව හා සුපරීක්ෂාකාරීව ආයෝජනය කිරීම, එම ආයෝජන කළඹ මඟින් අරමුදලට ඉහළම ප්‍රතිලාභයන් තහවුරු කරගැනීම

සඳහා එම ඕනෑම අයෝජනයක් හෝ සුරකුම් රඳවා ගැනීම, විකිණීම හෝ වෙනත් ආකාරයකට අපහරණය කිරීම මඟින් භාර අරමුදල කළමනාකරණය හා සංවර්ධනය කිරීම.

(ඇ) භාරයේ අරමුණු සඳහා පාදකවන සහ හෝ අවශ්‍ය පරිදි රටේ පවත්නා නීතියට අනුව රජයේ හෝ වෙනත් අධිකාරියකින්, අයිතියකින්, වරප්‍රසාදයකින්, බලපත්‍ර සහ සහන ලබාගැනීම.

(ඈ) ඕනෑම ආකාරයකින් රැස්කරගන්නා ආදායම්, භාරයේ ඉහත අරමුණු වර්ධනය කර ගැනීම සඳහා යෙදවිය යුතු අතර එම ආදායම් මුදලින් හෝ වෙනත් ආකාරයකින් පුද්ගලයන් හෝ ආයතනවලට භාරයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා නොවන කාර්යයන් සඳහා බෙදා නොහැරිය යුතුය.

(ඉ) භාරයේ ඕනෑම අරමුණක් ඉටුකර ගැනීමට අදාළ වන අනුශාංගික හෝ යෝග්‍ය වන නීත්‍යානුකූල දේ කිරීමට.

(ඊ) භාරයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ඔවුන් සිතන වඩාත් උචිත ක්‍රියාවෙහි යෙදීම සඳහා ඔවුන්ට පැවරී ඇති බලය සහ අභිමතය භාරකරුවන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ තහවුරු කර ගැනීම.

1.4 ප්‍රතිලාභීන්

---------------

භාර ඔප්පුවේ 07 වගන්තිය අනුව, භාරයේ ප්‍රතිලාභීන් වන්නේ මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය, මාර්ග සංවර්ධන අධිකාරිය, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය සහ හෝ ඔවුන්ගේ අනුප්‍රාප්තික ආයතන හෝ භාර අරමුදලෙන් අරමුදල් ලබාගැනීමට බලය ලැබෙන භාරයේ ප්‍රතිලාභියකු වශයෙන් රජය විසින් අනුමත කරන ලද වෙනත් ඕනෑම රාජ්‍ය ආයතනයක් වේ.

1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.6 තත්ත්වාගණනය කළ විගණන මතය

----------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

------------------

2.1 මතය

---------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට නඩත්තු භාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මාගේ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

----------------------------------------

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

--------------------------

ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් රු.227,106 ක් වටිනා භාණ්ඩාගාර බිල්පත් සහ රු.73,046 ක් වූ ඒ සඳහා පොලිය 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි.

2.2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

-------------------------------------------------

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | |
| (i) 4 වගන්තිය | භාර අරමුදලේ වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කර පෙර වර්ෂයේ සැප්තැම්බර් 15 දිනට පෙර ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්වරයාට හා රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්වරයාට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනය පිළියෙල කර අවශ්‍ය පරිදි ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) 4.3 වගන්තිය | වාර්ෂික කාර්ය සාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 5 ඡේදය | නිශ්චිත කාල පරිච්ඡේදය තුළ අරමුදල සාර්ථකව ක්‍රියාත්මක වීම තහවුරු කර ගැනීම සඳහා මාසිකව, කාර්තුමය හා වාර්ෂික ආදී වශයෙන් අපේක්ෂිත මූල්‍ය හා භෞතික ඉලක්ක මතුකර දක්වමින් සමස්ත ව්‍යාපෘති කාල පරිච්ඡේදය ආවරණය වන පරිදි විස්තරාත්මක සමස්ත සැලැස්මක් පිළියෙල කළ යුතුය. කෙසේ වුවද එවැනි සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඈ) | හාර ඔප්පුව | |
| | (i) 4 වගන්තිය | රු.මිලියන 3,725.4 ක රජයේ දායකයෙන් ඉටුකරගත යුතු හාර ඔප්පුවේ 4 වගන්තියේ දක්වා ඇති අපේක්ෂිත අරමුණු ඉටුකර ගෙන නොතිබුණි. |
| | (ii) 19 වගන්තිය | තිරසාර මාර්ග නඩත්තු කිරීම සඳහා මූල්‍යායනය කිරීමේ කාර්යක්ෂමතාවය ඇගයීම හා භාර අරමුදලේ මෙහෙයුම් වැඩි දියුණු කිරීමේ ක්‍රම පරීක්ෂා කිරීම සඳහා භාර අරමුදල ආරම්භ කළ දින සිට වර්ෂ 3 කට පසුව භාර අරමුදලේ කාර්යයන් සමාලෝචනය කළ යුතුය. 2006 ජනවාරි 01 සිට බලපැවැත්වෙන පරිදි භාරය ක්‍රියාත්මක කර තිබුණද, භාර අරමුදලේ කළමනාකරණ මණ්ඩලය විසින් භාර අරමුදලේ මූල්‍ය හා භෞතික කාර්ය සාධනය සමාලෝචනය කර නොතිබුණි. |
| (ඈ) | 2005 ඔක්තෝබර් 26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයේ 4 ඡේදය | 2006 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි පෙට්‍රල් හා ඩීසල් විකිණීමෙන් රජයට ලැබෙන ආදායමෙන් පෙට්‍රල් එක් ලීටරයකින් රු.1 ක් හා ඩීසල් එක් ලීටරයකින් රු.0.50 ක් භාර අරමුදලට බැරවන සේ රජය විසින් වෙන් කළ යුතුය. මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමට නොහැකි වීමෙන් අපේක්ෂිත ප්‍රතිඵල ඉටු කරගැනීමට නොහැකි විය. |

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය තුළ හා 2014 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| **ප්‍රභවය** | **ණය ගිවිසුමේ මූල්‍යායනය සඳහා එකඟ වූ මුදල** | | **2014 වර්ෂය තුළ උපයෝජනය කළ අරමුදල්** | | **2014 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය කළ අරමුදල්** | |
|---|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ප්‍රදාන නියෝජිතායතනය | 10.5 | 1,365 | 6.69 | 870.22 | 8.34 | 1,083.78 |
| ශ්‍රී ලං ර | - | - | - | 3,715.43 | 182.31 | 23,700.16 |
| | 10.5 | 1,365 | 6.69 | 4,585.65 | 190.65 | 24,789.94 |

3.2 භෞතික ප්‍රගතිය

------------------

මාර්ග නඩත්තු කිරීමේ කාර්යයන් සඳහා මාර්ග සංවර්ධන අධිකාරියට අරමුදල් සැපයීමට අමතරව ජාතික මාර්ග 10 ක මාර්ග කොටස් කිහිපයක නඩත්තු වැඩ, මාර්ග නඩත්තු භාර අරමුදල විසින් සිදු කර තිබුණි. ප්‍රගති වාර්තාවලට අනුව 2013 වර්ෂයේ ආරම්භ කරන ලද කිලෝමීටර 43.08 ක දිගින් යුත් ජාතික මාර්ග 08 ක නඩත්තු වැඩ 2014 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණ කර තිබුණි. තවද කිලෝමීටර 10.6 ක දිගින් යුතු ජාතික මාර්ග 02 ක නඩත්තු වැඩ සමාලෝචිත වර්ෂයේදී සිදු කරමින් තිබුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය

-----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2006 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 වගන්තියට අනුව, රු.මිලියන 500 ක් හෝ ඊට වැඩි වටිනාකමක් වූ කොන්ත්‍රාත් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගත යුතුය. කෙසේ වුවද මහනුවර - මහියංගනය - පදියතලාව මාර්ගයේ මතුපිට ඇතිරීම් හා නඩත්තු වැඩ පිළිබඳ කොන්ත්‍රාත්තුව රු.මිලියන 365.1, රු.මිලියන 224 හා රු.මිලියන 235.2 ක ඇස්තමේන්තුගත පිරිවැයට පැකේජ 3 කට වෙන්කර, එම කොන්ත්‍රාත් 3 ම එකම කොන්ත්‍රාත්කරුට ප්‍රදානය කර තිබුණු බව නිරීක්ෂණය විය. තවද කටුගස්තොට - කුරුණෑගල - පුත්තලම මාර්ගයේ ඇස්පෝල්ට් ඇතිරීම හා නඩත්තු වැඩ රු.මිලියන 440.6, රු.මිලියන 435.6 හා රු.මිලියන 463 ක ඇස්තමේන්තුගත පිරිවැයට පැකේජ 3 කට වෙන්කර ඉහත අවශ්‍යතාවයට පටහැනිව වෙනත් කොන්ත්‍රාත්කරුවකුට ප්‍රදානය කර තිබුණි.

(ආ) මාර්ග නඩත්තු වැඩ සඳහා ඉංජිනේරු ඇස්තමේන්තු තාත්වික ආකාරයට පිළියෙල කර නොතිබූ බව නිරීක්ෂණය විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත විස්තර කෙරේ.

(i) කටුගස්තොට - කුරුණෑගල - පුත්තලම මාර්ගයේ කිලෝමීටර 45 + 500 සිට කිලෝමීටර 54 + 000 දක්වා කොටසේ නඩත්තු වැඩ සඳහා පිළියෙල කරන ලද ප්‍රමාණ බිල්පත්‍රවල ජලාපවහන පද්ධතියක් ඉදිකිරීම ඇතුළත් කර නොතිබුණි. කෙසේ වුවද ජලාපවහන පද්ධතියක් ඉදිකිරීම සඳහා විචලන නියෝගයක් යටතේ රු.25,275,724 ක මුදලක් ගෙවා තිබුණි.

(ii) කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද ලංසුවල දැක්වෙන මාර්ග නඩත්තු වැඩ සඳහා රේටයන් ඉංජිනේරු ඇස්තමේන්තු සමඟ සැලකිය යුතු ලෙස වෙනස් වී තිබුණු බව නිරීක්ෂණය විය. එබැවින් මහනුවර - මහියංගණය - පදියතලාව මාර්ගයේ කිලෝමීටර 15 + 000 සිට කිලෝමීටර 20 + 000 දක්වා කොටසේ නඩත්තු වැඩ සඳහා භාරගත් ලංසු පිළිබඳ විෂයයන් 17 ක් සඳහා රේටයන් ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සියයට 80 කින් ඉක්මවා තිබුණි.

3.4 මතභේදයට තුඩුදෙන කරුණු

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වයඹ පළාතේ ජාතික මාර්ගවල මාර්ග නඩත්තු වැඩ සඳහා සමාලෝචිත වර්ෂය තුළ කරන ලද රු.209,560,000 ක වෙන් කිරීමෙන් රු.24,954,594 ක මුදලක් භාර අරමුදලට අදාළ නොවන වෙනත් වැඩ සඳහා වැය කර තිබුණි.

(ආ) භාර අරමුදල් ලේකම් කාර්යාලයට කාර්මික සහාය පිළිබඳ කාර්යය සඳහා පත්කරන ලද උපදේශකවරුන් විසින් කරන ලද නිර්දේශයට අනුව, නියැදි පදනමක් මත මාර්ග නියෝජිතායතන පිළිබඳ මූල්‍ය විගණනයන් සිදුකිරීම හා ඊළඟ වර්ෂය සඳහා භාර අරමුදලේ කළමනාකරණය වෙනුවෙන් ස්වකීය අයවැය පිළියෙල කිරීම සහ එය ජාතික අයවැය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා භාර අරමුදල විසින් කටයුතු කළ යුතුය. කෙසේ වුවද එම යෝජනා ක්‍රියාත්මක කිරීමට භාර අරමුදල විසින් පියවර ගෙන නොතිබුණි.